# 11 ශ්‍රේණිය - පිළිතුරු

## පාඩම - 16 නිමල දහම රැකුණු අයුරු

1. මහා පරිනිර්වාන සූත්‍රය

2.

| | ප්‍රථම ධර්ම සංගායනාව | දෙවන ධර්ම සංගායනාව | තෙවන ධර්ම සංගායනාව | සිව්වන ධර්ම සංගායනාව |
|---|---|---|---|---|
| බුද්ධ පරිනිර්වාණයෙන් | තෙමසකට පසු | වසර සියයකට පසු | වසර 236කට පසු | ක්‍රි.පූ. පළමුවැනි සියවසේ |
| ප්‍රධාන හේතුව | සුභද්‍ර භික්ෂුනමගේ නුසුදුසු වචනය | වජ්ජිපුත්තක භික්ෂූන්ගේ අකැප දස වස්තුව | ලාභ අපේක්ෂාවෙන් දුසිල් භික්ෂූන් සසුන් ගත වීම | ත්‍රිපිටකධාරී මහතෙරුන් වහන්සේලා හා ධර්මය විනාශ වීමේ අවදානම |
| මූලිකත්වය | මහා කාශ්‍යප මහරහතන් වහන්සේ | සබ්බකාමී මහරහතන් වහන්සේ | මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ | |
| දායකත්වය | අජාසත්ත රජු | කාලාශෝක රජු | ධර්මාශෝක රජු | ප්‍රාදේශීය නායකයකු |
| ස්ථානය | රජගහනුවර වේභාර පර්වතය පාමුල සප්තපර්ණි ගුහා ද්වාරය අභියස | විශාලා මහනුවර වාලුකාරාමය | පැළලුප් නුවර අශෝකාරාමය | මාතලේ අළුවිහාරය |
| සහාය වූ පිරිස | උපාලි තෙරුන් වහන්සේලා | රේවත, සබ්බකාමී, යස, සාළ්හ, ඛුජ්ජිසෝභිත, වසභගාමී, සුමන, සානවාසී, සම්භූත තෙරුන් වහන්සේලා | මහින්ද මහාරක්ඛිත, මහාදේව තෙරුන් වහන්සේලා | |
| ගත වූ කාලය | මාස 7 | මාස 8 | මාස 9 | |
| සහභාගි වූ ප්‍රමාණය හා සංගායනාව හැඳින්වෙන නාමය | 500 පංචසතිකා සංගීතිය | 700 සත්තසතිකා සංගීතිය | 1000 සාහස්සිකා සංගීතිය | 500 පුස්තකාරූඪ සංගීතිය |



සැකසුම - වයි. පී. පී කව්සිගමුව
ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රතිඵල | 1. විසිරී තිබූ ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම.<br>2. ධර්ම විනය කොටස්කර භාණක පරපුරකට පැවරීම.<br>3. නව විනය නීතිනොපැන වීමටත් පැන වූ විනය නීති ආරක්ෂා කිරීමටත් ප්‍රතිඥා දීම. | 1. විනය විරෝධී කටයුතු කළ භික්ෂූන්ට නිග්‍රහ කිරීම.<br>2. අකැප දස වස්තුව ප්‍රතික්ෂේප කිරීම.<br>3. පළමු සංගීතියේ දී ඇති කරගත් සම්මුතිය අනුව ශික්ෂාපද ලිහිල් නොකර ඉදිරියට පවත්වා ගෙන යාම.<br>4. අටළොස් නිකාය බිහිවීම. | 1. දුසිල් මහණුන් හැටදාහක් සුදුවත් හඳවා සසුනෙන් නෙරපා හැරීම.<br>2. ශාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම.<br>3.කථාවත්ථුප්පකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම.<br>4. ත්‍රිපිටකය ම අංග සම්පූර්ණ වීම.<br>5. දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය | 1. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම. |

3.

| සූත්‍ර ධර්ම නිකාය වශයෙන් | භාණක පරපුර |
|---|---|
| 1. දීඝ නිකාය | ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 2. මජ්ඣිම නිකාය | සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 3. අංගුත්තර නිකාය | අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 4. සංයුක්ත නිකාය | මහාකාශ්‍යප තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව |
| 5. ඛුද්දක නිකාය | සියලු ම භික්ෂූන් වහන්සේලාට |

4. ■ ක්‍ෂුද්‍රා, අනුක්‍ෂුද්‍රා ශික්ෂාපද සම්මුතිය අභිබවා යමින් වජ්ජිපුත්තක භික්ෂූන් සම්මත කොටගත් දස අකැප වස්තු පාචීනක හා පාවෙය්‍යක යන දෙපාර්ශ්වයට ම අයත් භික්ෂූන්ගෙන් සමන්විත කමිටුවක් විසින් සලකා බලන ලදුව ඒවා ධර්ම විනයට අනුකූල නොවන බව තීරණය කිරීම

■ තත්කාලීන ව සසුනේ විසූ වගකිව යුතු මහ රහතන් වහන්සේලා ප්‍රධාන ථේරවාදී භික්ෂූන් “විනය සසුනේ ආයුෂය වේ” යන පිළිගැනීම මත දස වස්තුව අකැප බව ප්‍රකාශයට පත් කිරීම

■ අකැප දසවස්තුව පිළිගත් දුර්මතධාරී වජ්ජිපුත්තක භික්ෂූන් දස දහසක් සසුනින් ඉවත් කර සංඝ සංශෝධනයක් සිදු කිරීම

■ නිර්මල ධර්ම විනය ගරුකළ භික්ෂු පරපුර ථේරවාදී වශයෙන් වෙන ම සම්ප්‍රදායක් ලෙස සංවිධානය වීම.

■ දස වස්තුව පිළිගත් සසුනින් නෙරපන ලද භික්ෂූන් මහා සාංඝික නමින් වෙන ම සංවිධානයක් පිහිටුවා ගැනීම ද දෙවැනි ධර්ම සංගායනාවේ දී සිදුවිය.

5 ■ අධර්මවාදීන් සසුනෙන් නෙරපා ශාසන ශෝධනයක් ඇති කිරීම.

■ පරවාද පන්සියයක් හා ඒවා ඛණ්ඩනය කිරීම සඳහා වන සකවාද පන්සියයක් ද ඇතුළත් කර කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් සම්පාදනය කිරීම.

■ අභිධර්ම පිටකය ප්‍රකරණ හතක් බවට පත් කිරීම.

■ ශාසනික තත්ත්වය අවුල් සහගත වීම හා භික්ෂු වෙස් ගත්තවුන් බහුල වීම ද නිසා සිල්වත් භික්ෂූන් වහන්සේලා වසර හතක් පොහොය කර්මාදී පිළිවෙත් සිදු නොකළ අතර නැවත පොහොය කර්මාදිය සිදු කිරීමට ඉඩ සැලසුණේ ද මේ සංගායනාවෙන් පසුව වීම.

■ ධර්මාශෝක රජතුමාගේ ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව ථේරවාදී බුදුදහම රටවල් 9 කට ව්‍යාප්ත කරවීම.

6.

| | ප්‍රදේශය | නායකත්වය | ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය හෝ කථා වස්තුව |
|---|---|---|---|
| 1 | කාශ්මීර ගන්ධාරය | මජ්ඣන්තික තෙරුන් වහන්සේ | ආසිවිසෝපම සූත්‍රය |
| 2 | මහිස මණ්ඩලය | මහාදේව තෙරුන් වහන්සේ | දේවදූත සූත්‍රය |
| 3 | වනවාසී දේශය | රක්ඛිත තෙරුන් වහන්සේ | අනමතග්ග සංයුත්තය |
| 4 | අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ | අග්ගික්ඛන්ධෝපම සූත්‍රය |
| 5 | මහාරට්ඨ | මහා ධම්ම රක්ඛිත තෙරුන් වහන්සේ | මහානාරද කස්සප ජාතකය |
| 6 | යෝනක රට්ඨ | මහා රක්ඛිත තෙරුන් වහන්සේ | කාලකාරාම සූත්‍රය |
| 7 | හිමවන්ත ප්‍රදේශය | මජ්ඣිම තෙරුන් වහන්සේ | ධම්මචක්කප්පවත්තන සූත්‍රය |
| 8 | ස්වර්ණභූමිය | සෝණ, උත්තර යන තෙරුන් වහන්සේලා | බ්‍රහ්මජාල සූත්‍රය |
| 9 | තම්බපණ්ණිය (ශ්‍රී ලංකාව) | මිහිඳු මහරහතන් වහන්සේ | චූලහත්ථිපදෝපම සූත්‍රය |

7.■ ධම්මසංගණිප්පකරණය

■ විභංගප්පකරණය

■ ධාතුකථාප්පකරණය

■ පුද්ගලපඤ්ඤත්තිප්පකරණය

■ පට්ඨානප්පකරණය

■ යමකප්පකරණය

■ කථාවත්ථුප්පකරණය

8. ■ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම.

■ පර්යාප්තිය හෙවත් ත්‍රිපිටක බුද්ධ වචනය ආරක්ෂා කර ගැනීමට මුල්තැන දිය යුතු ය යන ආකල්පය සමාජ ගත වීම.

■ පසුකාලීන ථේරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට මෙම ග්‍රන්ථ උපකාරී වීම.

■ ලෝකයේ වෙනත් රටවල ථේරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට සුරක්ෂිත ව පැවැති ලාංකේය ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.

■ බුදු දහම ව්‍යාප්ත නොවූ බටහිර රටවල පසු කාලයේ ඒ පිළිබඳ දැනුම බෙදාහැරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.

■ එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවීම හා එමගින් පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදාහැරීමට හැකි වීම. මෙය පසුකාලීන ප්‍රතිඵලයකි.

## පාඩම - 17 මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය

1. ■ 236

2. ■ දෙවනපෑතිස් රජතුමා

■ ධර්මාශෝක අධිරාජයා

3. ■ දඹදිව බුද්ධ ගයාවෙහි වැඩසිටින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම වීමයි.

4. ■ අනුලා බිසව

5. ■ මහා විහාරය

6. ■ මහා අරිට්ඨ කුමරු

7. ■ භික්ෂුණී සමාජය මෙරට පිහිටුවීමයි.

8. ■ ඉන්දියාවේ පැවති බ්‍රාහ්මී අක්ෂර

9. ■ කාන්තා පැවිද්ද ආරම්භ කිරීම

■ ශ්‍රී මහා බෝධිය වැඩමවීම

10. ■ දේශීය භික්ෂු සමාජය ආරම්භ කිරීම.

■ මහා විහාරය කේන්ද්‍ර කොටගත් ජාතික අධ්‍යාපන ක්‍රියාවලියක ආරම්භය

■ සංඝමිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ සම්ප්‍රාප්තිය

■ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවා රෝපණය කිරීම.

■ ලක්දිව භික්ෂුණී සමාජය ආරම්භ වීම.

■ සිංහල අක්ෂර මාලාව සකස් ව ප්‍රචලිත වීම.

■ ශ්‍රී ලංකාවේ බෞද්ධ ජන ජීවිතයට ම ආවේණික වූ වන්දනාමාන හා පුදසිරිත් ඇති වීම.

## පාඩම - 18 හෙළ බොදු කලාවේ අසිරිය

1. ■ බෝධිය, වජ්‍රාසනය, පද්මය, සිරිපතුල,ධර්ම චක්‍රය, ස්තූපය

2. ■ ආබද්ධ පිළිම - පිළිමයට පිටු පසින් ගලක් හෝ වෙනත් බාහිර ආධාරකයක් ඇති ව නිමවා ඇති පිළිම - ප්‍රසිද්ධ අවුකන බුද්ධ ප්‍රතිමාව

■ අනාබද්ධ පිළිම - ආධාරකයක් නොමැති ව නිමවා ඇති පිළිම - මාළිගාවෙල බුදු පිළිමය

3. 1. ධ්‍යාන මුද්‍රාව

හිඳි පිළිමවල බොහෝවිට දක්නට ඇත. වම් අත්ල මත දකුණු අත්ල පිහිටුවා තිබීමෙන් මෙම මුද්‍රාව අර්ථවත් කෙරේ. මෙයින් භාවනානුයෝගී සමාධිගත ඉරියව්ව සංකේතවත් කෙරේ.

උදාහරණ - අනුරාධපුරයේ ප්‍රසිද්ධ සමාධි පිළිමය

2. අභය මුද්‍රාව

දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කෙරෙන්නේ අභය මුද්‍රාවයි. ලෝක සත්ත්වයාට උරුම ව ඇති සසර බිය දුරු කිරීම මෙයින් පිළිබිඹු කරන බව විද්වත් මතයයි.

උදාහරණ - අවුකන ප්‍රතිමාව හා ගල් විහාර ප්‍රතිමාව

3. විතර්ක මුද්‍රාව

දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මාපට ඇඟිල්ලේ තුඩ මත තබා කවයක් ලෙස ඇඟිලි දෙක සකසා තිබීම මෙහි විශේෂ ලක්ෂණයයි. මෙමගින් ගැටලු විසඳීමට බුදුරදුන්ගේ යොමු වීම සංකේතවත් කෙරේ.

4. ධර්ම චක්‍ර මුද්‍රාව

ධර්ම චක්‍ර මුද්‍රාව සඳහා අත් දෙක ම භාවිත කෙරේ. පළමු ව දකුණු අත්ල පිටතට හරවා එය පපුවේ මට්ටමට ගෙන එම අතේ මහපට ඇඟිල්ලේ හා දබර ඇඟිල්ලේ තුඩු දෙක ස්පර්ශ වන අයුරින් කවයක් සෑදෙන ලෙස එකට තබාගෙන ඇත. අනතුරුව පපුව ප්‍රදේශයට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් නිරූපිත මුද්‍රාව ධර්ම චක්‍ර මුද්‍රාව වේ. මෙයින් ධර්මය පැහැදිලි කිරීම පෙන්නුම් කෙරේ.

5. භූමි ස්පර්ශ මුද්‍රාව

මෙය හිඳි පිළිමවලට පමණක් ආවේණික මුද්‍රාවකි. හිඳි පිළිමයේ දකුණු දණ හිසට උඩින් තම දකුණු අත්ල ඇතුළට සිටින සේ ඇඟිලි දිග හැර පහතට සිටින ආකාරයට මූර්තිමත් කෙරේ. වම් අත භාවනානුයෝගී ඉරියව්වෙන් තබා ඇත. මෙයින් බුදුරදුන් මාර පරාජයේ දී පොළොව සාක්ෂි දැරීම සංකේතවත් කෙරේ.

6. වරද මුද්‍රාව

බොහෝ විට මෙය හිඳි පිළිමවල දැකිය හැකි මුද්‍රාවකි. දකුණු අත පහත් කොට අත්ල උඩු අතට හරවා ඇඟිලි දිගහැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණයයි. වරදානය මේ තුළින් සංකේතවත් කෙරේ.

4. 1. වීරාසනය

වාඩි වී සිටින විට වම් පාදය දකුණු පාදයට යටින් හා දකුණු පාදය වම් පාදයට උඩින් පිහිටන ලෙස තබා හිඳගෙන සිටින ඉරියව්ව වීරාසනයයි.

2. භද්‍රාසනය

භද්‍ර යන්නෙන් යහපත් බව, සුබ බව අර්ථවත් වේ. එබඳු යහපත් වූ සුබ වූ ආසනය භද්‍රාසනයයි. මඳක් උස් වූ ආසනයක හිඳගෙන කලවා දෙපසට විහිදුවා පාද පහළින් ඇති පද්මයක් වැනි පීඨයක් මත තබාගෙන සිටීම එම ආසනයේ ස්වභාවයයි.

3. පද්මාසනය

අර්ථයට අනුකූල ව පද්මයක ආකාරයට හිඳගෙන සිටීම මෙම ආසනයේ ලක්ෂණයයි. දණහිස් නමා පතුල් උඩ අතට සිටින සේ වම් පතුල දකුණු කලවා මත ද දකුණු පතුල වම් කලවා මත ද තබාගෙන සිටින ඉරියව්ව පද්මාසනය නම් වේ.

5. ■ ප්‍රතිමාඝර ප්‍රධාන වර්ග තුනකි. එනම්

1. ගන්ධ කුටි

2. පාසාද

3. ගෙඩිගේ වශයෙනි.

1. ගන්ධ කුටි

බුදුරජාණන් වහන්සේ වැඩ විසූ කුටිය ගන්ධ කුඨය ලෙස හැඳින්විණි. මුල් ම ප්‍රතිමාඝර සඳහා මෙම නම යොදන්නට ඇත්තේ එම අර්ථයෙනි. මෙය සරල ප්‍රතිමාඝර විශේෂයකි. කිරිබත් වෙහෙර, තොළුවිල, පන්කුළිය යන ස්ථානවල මෙබඳු ප්‍රතිමාඝර පැවැති බව සැලකේ.

2. පාසාද

මෙය තරමක් විශාල මහල් සහිත ගොඩනැගිල්ලක් බව වචනාර්ථයෙන් ම පැහැදිලි ය. මිගාර මාතු පාසාද සංකල්පය අනුව යමින් මෙය නිර්මාණය කරන්නට ඇතැයි සැලකේ. රත්න ප්‍රාසාද ගොඩනැගිල්ල, බිසෝ මාළිගා ගොඩනැගිල්ල යන ස්ථානවලින් මෙයට අදාළ ආකෘති හමුවේ.

3. ගෙඩිගේ

මෙය ප්‍රමාණයෙන් විශාල වූ පිළිම ගෙවල් විශේෂයකි. මෙහි වහලය පවා ගඩොළින් නිමවා ඇත. අනුරාධපුර යුගයේ අවසාන භාගයේ පටන් ගෙඩිගේ ක්‍රමයේ පිළිම ගෙවල් නිර්මාණය කිරීම සිදු ව ඇත. දැනට ශේෂ ව ඇති මෙබඳු හැඩයෙන් යුතු ප්‍රතිමාඝර කිහිපයක් පොළොන්නරුවෙන් හමුවේ. මහ පැරකුම්බා රජු විසින් කරන ලදැ යි සැලකෙන ථූපාරාම පිළිමගෙය, තිවංක පිළිමගෙය, ලංකාතිලක පිළිමගෙය, ප්‍රසිද්ධ නාලන්දා ගෙඩි ගෙය මෙයට අයත් ය.

6. ■ දෙගල් දොරුව විහාරය

■ මැදවල විහාරය

■ රන්ගිරි දඹුළු විහාරය

■ කුරුණෑගලට සමීප ව ඇති රිදී විහාරය

■ බඹරගල විහාරය

■ කැලණියේ පැරණි විහාර මන්දිරය

7. ■ දෙවරගම්පොළ සිල්වත් තැන

■ හිරියාලෙ නයිදෙ

■ දේවේන්ද්‍ර මූලාචාරියා

8. ■ චිත්‍ර ඇඳීමේ දී රේඛා කර්මය හා වර්ණ පූර්ණය යන අංග දෙකින් යුතු ව එය සිදුකර ඇත. එනම් පළමුවෙන් රූපවල බාහිර රේඛා ඇඳ අනතුරුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීමයි.

■ රතු, සුදු, කහ, කළු යන වර්ණ වැඩි වශයෙනුත් නිල් සහ කොළ පාට අඩුවෙනුත් යොදාගෙන ඇත.

■ කහ සහ සුදු පාටින් ඇඳි සිතුවම් රතු පසුබිමක දක්නට ලැබේ.

■ මිනිස් රූප, සත්ත්ව රූප හා ගස් වර්ග ස්වාභාවික පරිසරයේ පවත්නා ආකාරයෙන් ම ඇඳීම මේ යුගයේ සම්ප්‍රදාය නොවී ය. අඳින ලද එම රූප සැබෑ මනුෂ්‍ය හා සත්ත්වයින්ගේ භෞතික ශරීරයට අනුගත නොවේ. අඟපසඟ ද ශරීර පරිමාණුකූල ව නිමවා නැත. මිනිස් රූපවල මුහුණෙන් හෝ අත් සහ ඇඟිලිවලින් අදහස් ප්‍රකාශ කිරීමට උත්සාහ ගත් බවක් ද දැකිය නොහැකි ය. ගැහැනු හා පිරිමි රූප සිත්කලු ලෙස ඇඳ රසිකයින් ආකර්ෂණය කර ගැනීමට ද සමත් නොවේ.

■ එළිය අඳුර දැක්වීම හෝ පර්යාවලෝකය (ළඟ සහ ඈත වස්තු පෙනෙන ආකාරය) දැක්වීම ද සිදු කර නැත.

■ අඛණ්ඩ කථන ක්‍රමයට සිතුවම් ඇඳීම මේ යුගයේ ජනප්‍රිය වී ඇත. එනම් කිසි යම් කතා පුවතක එක් චිත්‍ර රාමුවක් නොව ඒ හා සම්බන්ධ සිදුවීම් පෙළක් නිරූපණය කිරීමයි.

9. ■ රිචඩ් හෙන්රිකස්

■ එම්. සාර්ලිස්

■ සෝලියස් මෙන්දිස්

■ ජෝර්ජ් කීට්

■ ඇල්බට් ධර්මසිරි

■ සෝමබන්දු විද්‍යාපති

10. ■ ඇල්බට් ධර්මසිරි මහතා

11. ■ ජෝර්ජ් කීට් මහතා

12. ■ කැලණි විහාරයේ අලුත් විහාර මන්දිරය

■ මාවිල සුමන කුසුමාරාමය

■ රණස්ගල්ල විහාරය

■ මැද්දෙපොල විහාරය

## පාඩම - 19 බුදු සමයෙන් පෝෂණය වූ සිංහල සාහිත්‍යය

1. ■ එළු සඳැස් ලකුණ

2. ■ කුරුණෑගල සාහිත්‍ය යුගයේ රචනා වූ මෙම ග්‍රන්ථය පාලි ජාතකට්ඨකථාව සිංහලයට නැගීමෙන් රචිත කෘතියකි. මෙය මහජනතාව අතර කෙතරම් ගෞරවාදරයට පාත්‍ර වූවා ද යන්න පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලෙස හැඳින්වීමෙන් ම පැහැදිලි වේ. අප බුදුරජාණන් වහන්සේ පාරමීදම් පුරන සමයේ හෙවත් බොධිසත්ව අවධියේ දී උපන් ආත්මභාව පිළිබඳ මෙහි විස්තර වේ. ධර්ම දේශනා ශෛලිය උපයෝගී කරගනිමින් රචිත මෙහි සඳහන් කතාවස්තු ප්‍රමාණය 547 කි. ආසන්න වශයෙන් ගෙන කතුවරයා මෙම ග්‍රන්ථය පන්සිය පනස් ජාතක පොත යනුවෙන් නම් කර ඇති බව පෙනේ. ජාතක පොතෙහි දීර්ඝත ම ජාතකය උම්මග්ග ජාතකයයි. එදා මෙන් ම අදත් විහාරස්ථානවල මෙම ග්‍රන්ථය එක් අයකු කියවද්දී අනෙක් අය සාධුකාර දෙමින් අසා සිටීම සිරිතක් ව පවතියි.

3. ■ සිංහල බෝධිවංසය

4. ■ විද්‍යා චක්‍රවර්තී පරාක්‍රම පණ්ඩිත

5. ■ මයූර සන්දේශය

■ තිසර සන්දේශය

6. ■ ද්විතීය ධර්මකීර්ති නාහිමිපාණන් වහන්සේ

7. ■ සැළලිහිණි සන්දේශය,

■ පරෙවි සන්දේශය,

■ කාව්‍යශේඛරය,

■ පඤ්චිකා ප්‍රදීපය,

■ බුද්ධිප්පසාදිනිය

8. ■ ලෝවැඩ සඟරාව

■ බුදුගුණ අලංකාරය

## පාඩම - 20 දැහැමි ධනය ගෙනෙයි සැපය

1. ■ නිවැරැදි කර්මාන්ත (නිවැරැදි රැකියා)

2. ■ කෘෂි කර්මාන්තය (කසි)

■ වෙළෙඳාම (වණිජ්ජා)

■ ගවයන් රැක බලාගැනීම (ගෝ රක්ඛ)

■ රාජ්‍ය සේවය (රාජ පෝරිස)

■ අනෙකුත් ශිල්ප කර්මාන්ත (සිප්පඤ්ඤතර)

3. ■ හොරට කිරීම, (තුලා කූට) හොරට මැනීම, (මාන කූට)

■ බාල දේ අගය කර විකිණීම (කංස කූට)

4. ■ අවි ආයුධ වෙළෙඳාම

■ සත්ත්ව වෙළෙඳාම

■ මස් වෙළෙඳාම

■ වස විස වෙළෙඳාම

■ මත් ද්‍රව්‍ය වෙළෙඳාම

5. ■ චතුර්විධ සැපය නම් අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ, අනවජ්ජ සුඛයයි.

■ අත්ථි සුඛය නම් ධාර්මික ව උපයා සපයාගත් ධනයක් තමනට ඇතැයි සිතා යමෙක් සතුටු වීම

■ භෝග සුඛය නම් ධාර්මික ව සපයා ගත් ධනය ධාර්මික ව පරිභෝග කිරීමෙන් ලබන සතුට

■ අනණ සුඛය නම් තමන් කිසිදු අයකුට කිසි ම ආකාරයේ ණයක් නැහැයි කියා සතුටු වීම

■ අනවජ්ජ සුඛය නම් "නිවැරැදි වූ කාය, වචී හා මනෝ කර්මයෙන් යුතු ව ක්‍රියා කිරීමෙන් ලබන සතුට

6. ■ උට්ඨාන සම්පදා

■ ආරක්ඛ සම්පදා

■ කල්‍යාණ මිත්තතා

■ සමජීවිකතා

7. ■ නිවන් සැපය සැප අතර උතුම් ම සැපයයි.

## පාඩම - 21 දැහැමි ව උපයා දැහැමි ව වැය කරමු

1. ■ අනේපිඩු මහ සිටුතුමාට

2. ■ සුදුසු ක්‍රියාව හෙවත් කළ යුත්තයි

3. ■ තමන් දැහැමින් උපයාගත් ධනය තමා වෙනුවෙන් මෙන් ම  සිය මවුපියන්, අඹු දරුවන්, සේවක ජනයා වෙනුවෙන් ද කැපකළ යුතුය.

■ ගින්නෙන්, ජලයෙන්, අදැහැමි රජ දරුවන්ගෙන් හා සොරුන් ගෙන් ධනය රැකගත යුතුය.

■ පංච බලි නම් වූ යුතුකම් පහක් ඉටු කළ යුතු ය.

■ මහණ බමුණන්ට දන් දියයුතුය. ( පැවිදි උතුමන්ට දානාදියෙන් සංග්‍රහ කිරීම)

4. ■ ඤාති බලි - ඤාතීන්ට සැලකීම ය.

■ අතිථි බලි -ආගන්තුක සත්කාරය

■ පුබ්බපේත බලිය - මිය ගිය ඤාතීන්ට යුතුකම් ඉටු කිරීම

■ රාජ බලි - රට වැසියන් වශයෙන් රජයට යුතුකම් ඉටු කිරීම

■ දේවතා බලි - දෙවියන්ට පින් දීම

5. ■ දන් දීම

■ ධර්මයෙහි හැසිරීම

■ නෑයන්ට සංග්‍රහ කිරීම

■ නිවැරැදි කර්මාන්ත කිරීම

## පාඩම - 22 පාලකයනට මග කියන බුදු දහම

1. ■ දානය - රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම අර්ථවත් කෙරේ. කෘෂි කර්මාන්තය, වෙළෙඳාම, සත්ත්ව පාලනය, ආදී කිසියම් ජීවන වෘත්තියක් ආරම්භ කොට ක්‍රියාත්මක කරගෙන යෑමට අවශ්‍ය පහසුකම් පාලකයා විසින් ලබාදිය යුතු ය. ඒ තුළින් රටත් සමාජයත් ස්වයංපෝෂිත තත්ත්වයට පත්කළ හැකි ය. එම සුභ සාධක සේවා දානයට අයත් වේ.

■ සීලය - පාලකයා කායික හා වාචසික සංවරයෙන් යුක්ත වීම මෙයින් අදහස් වේ. පාලිතයෝ නිතර ම පාලකයා අනුකරණයට යොමු වෙති. ගව රැළේ නායකයා ඇදට ගමන් කරන විට සෙසු ගවයෝ ද ඇදට ගමන් කරති. නායකයා කෙළින් යන විට සෙසු අය ද කෙළින් යති. එබැවින් නායකයා අනෙක් අයට ආදර්ශයක් වෙමින් සිල්වත් ව ක්‍රියා කළ යුතු ය. ප්‍රතිපත්තිගරුක විය යුතු ය. චාරිත්‍ර වාරිත්‍ර ගැන සැලකිලිමත් ව ක්‍රියා කිරීම මූලික වශයෙන්ම සීලයට අයත් වේ.

■ පරිත්‍යාගය - පාලකයා රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුව යනාදිය කැප කළ යුතු ය. එම කැප කිරීම පරිත්‍යාගය ලෙස අර්ථවත් කෙරේ.

■ ඍජු බව දේශපාලන හිතවත්කම් හා ඥාති සබඳතා ද නිවැරැදි තීන්දු තීරණ ගැනීමට බාධක වේ. එවැනි බාධක සහ බලපෑම්වලට යොමු නොවී සතර අගතියෙන් තොර ව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවංක ව කටයුතු කිරීම පාලකයාගේ ඍජු ගුණය වේ.

■ මෘදු බව යනු හදවතේ ඇති මොළොක් බවයි, තෙත් ගතියයි. ජනතාවට ආර්ථික හා සාමාජික ආදි වශයෙන් විවිධ ගැටලු හා අභියෝගවලට මුහුණ පෑමට සිදුවේ. එවන් අවස්ථාවන්හි දී පාලකයා ඒවාට විසඳුම් ලබා දීමට යොමු විය යුත්තේ කාරුණික හැඟීමෙනි. මොළොක් වූ හදවතිනි. ජන දුක හැඳින ක්‍රියා කිරීමෙනි.

■ තපසප - ඉඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියා කිරීම තපසයි.

■ අක්‍රෝධය - ක්‍රෝධ චේතනාවෙන් තොර ව කටයුතු කිරීම අක්‍රෝධයයි. වෙනත් පාලකයකුට හෝ රට වැසියකුට වෛර කිරීම, ක්‍රෝධ කිරීම දැහැමි පාලකයකුගේ පිළිවෙත නොවේ. සියලු රටවැසියන් තමන්ගේ දරුවන් ලෙස සිතා කවර හේතුවක් නිසාවත් වෛරයෙන්, ක්‍රෝධයෙන්, කෝපයෙන් ක්‍රියා නොකිරීම අක්‍රෝධය ලෙස හැඳින්වේ.

- අවිහිංසාව - පාලකයා හිංසා සහගත ක්‍රියාවලින් ද ඈත් විය යුතු ය. හිංසාව කායික මෙන් ම මානසික ව ද වේ. මිනිසා ඇතුළු සෑම සත්ත්වයෙකු ම හිංසනයට අකැමැති ය. අවිහිංසාවට කැමැති ය. එබැවින් නායකයාගේ වගකීම විය යුත්තේ සියලු ම හිංසාකාරී ක්‍රියාවලින් තොර ව මිනිසා ඇතුළු සෑම ජන කොට්ඨාසයක් ම පාලනය කිරීම ය. නමුත් රටේ පවත්නා නීතියට අනුගත ව දඬුවම් පැමිණවීමෙන් බැහැර වීමක් මෙයින් අදහස් නොකෙරේ.

- ඉවසීම - පාලකයා අනිවාර්යයෙන් ම ඉවසිලිවන්ත අයෙකු විය යුතු ය. දුරදිග සිතාබලා කටයුතු කරන්නෙකු ද විය යුතු ය. එසේ නොවී ක්ෂණික තීරණවලට එළඹ කටයුතු කළහොත් රටක පමණක් නොව ඕනෑ ම සංවිධානයක නායකත්වයේ පිරිහීම කඩිනම් වන්නේ ය. තාරුණ්‍යය හා බලය, ඉවසීම පලවා හරින සාධක වේ. නොඉවසිල්ල බොහෝ ගැටලු ඇති කරන්නක් ය.

- අවිරෝධතා - පාලකයකුට කටයුතු කිරීමට සිදුවන්නේ සම්පූර්ණයෙන් ම සමාන අදහස් දරන පිරිසක් සමග නොවේ. විවිධ අදහස් හා මතවාද දරන පිරිස් සමග මධ්‍යස්ථව හා ගැටුමින් තොර ව කටයුතු කිරීම අවිරෝධතාවයි. තම අදහසට හෝ මතයට හෝ විරුද්ධ වූවා යැයි යමකුගෙන් පළිගැනීමට පාලකයකු යොමු වන්නේ නම් ඔහුට සාමකාමී සාර්ථක පාලනයක් කිරීමට නොහැකි වනු ඇත.

2.

1. දානය
2. සීලය
3. පරිත්‍යාගය
4. ඍජු බව
5. මෘදු බව
6. තපස
7. අක්‍රෝධය
8. අවිහිංසාව
9. ඉවසීම
10. විරුද්ධ නොවීම

3. ■ සීලය, විරමණය

4. ■ පංච සීලය ද රාජ්‍ය පාලන මූලධර්මයක් වශයෙන් ගත හැකි ය. දේශය, කුලය, ජාතිය, ආගම කුමක් වුව ද ශිෂ්ඨ සම්මත වූ මානව සමාජයක් තුළ සැබවින් ම පංච දුෂ්චරිතය ගැරහුමට ලක් විය යුත්තකි.

   - පාලකයකු ප්‍රාණඝාතයෙන් වැළකීම යනු සමස්ත සත්ත්ව සංහතියේ ම ජීවත් වීමේ අයිතිය සුරක්ෂිත කිරීමකි. බියෙන් සැකෙන් තොර ව නිදහසේ තම ජීවිතය පවත්වාගෙන යෑමට සෑම අයකුට ම අවස්ථාව ලබා දීමකි. සමහර පාලකයින් තිරිසන්ගත සතුන්ගේ ජීවිත සුරක්ෂිත කරලීමේ අරමුණින් මාඝාත ආඥාව පවා පැනවූ බවට තොරතුරු ලක් ඉතිහාසයේ ද දැක්වේ. ඒ නිසා ප්‍රාණඝාතයෙන් වළකින හා වළක්වන අයෙක් විය යුතුය.

   - රාජ්‍ය පාලකයින් යනු ජනතාවගේ අයබදුවලින් යැපෙන පිරිසකි. ඒ නිසා ඔවුන්ගේ යුතුකම විය යුත්තේ මහජන දේපොළ සුරක්ෂිත කිරීමයි. ඒ නිසා පාලකයා ජනතාවගේ සම්පත් වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. පාලකයෙකු මහජන දේපොළ අනියමින් තමන් සන්තක කර ගැනීම සොරකම් කිරීමක් වේ. පාලකයා ජනතාවගේ සම්පත් සුරකින අයෙක් විය යුතුය.

- පාලකයා සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන අයෙකු විය යුතු ය. පාලකයා වැරදි කාම හැසිරීමට යොමු නොවිය යුතු ය. වැරැදි ලෙස කාම සේවනයට යොමු වීමෙන් පාලකයකුගේ පෞරුෂය බිඳ වැටෙයි. ඔහු ප්‍රජාවට මග පෙන්වීමට නුසුදුස්සෙකු වේ. පිරිහුණු චරිතයක් ඇත්තකු ද වේ. එනිසා පාලකයා සදාචාර සම්පන්න විය යුතුය. එවැනි පාලකයන්ට ජනතා ආකර්ෂණය හිමිවේ.

- පාලකයාගේ පැවැත්ම තහවුරු වීමට ඔහු පිළිබඳ ව ජනතාව තුළ විශ්වාසයක් තිබිය යුතු ය. ඒ සඳහා සත්‍ය වචන කතා කිරීම අත්‍යවශ්‍ය වේ. ඔහු කියන දේ කරන අයකු මෙන් ම කරන දේ කියන අයකු ද විය යුතු ය.තමන් බොරුවෙන් මුළාකිරීම නිසා ජනතාව පාලකයා කෙරෙහි ද්වේෂයෙන් කල් ගෙවන අතර; කලහකාරී ක්‍රියාමාර්ග තුළින් ප්‍රතිචාර දැක්වීමට ද පෙළඹිය හැකි ය. සත්‍ය වචන කතා කරන පාලකයෙක් රට වැසියා පාලකයාගෙන් බලාපොරොත්තු වේ.

- මද්‍යසාර භාවිතයෙන් විකෘති වූ මානසිකත්වයක් ඇති අයෙකුට යුක්තිය හා සාධාරණය ඉටුකෙරෙන පරිදි තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් නැත. මතට යොමුවූ ඇතැම් පාලකයෝ බොහෝ විට අවස්ථාවාදීන්ගේ ගොදුරු බවට පත්වෙති. එවිට ඔවුහු තම සිතැඟියාවන් පාලකයා ලවා ඉටු කර ගැනීමට පෙළඹෙති. පාලකයන් බොහෝ අගතිගාමී තීරණවලට එළඹ විනාශ වන්නේ මේ නිසා ය. පාලකයා අනුකරණය කරමින් ජනතාව ද මතට යොමුවූ විට රට තුළ බොහෝ සමාජ හා ආර්ථික ගැටලු ඇතිවේ.

- දැහැමි පාලකයා පන්සිල් රකී. අන් අයද පන්සිල් හි පිහිටුවයි. පස්පව් කරන අයට පන්සිල් රැකීමේ ආනිශංසය ද කියා දෙයි. පංච සීල ප්‍රතිපත්තිය ආරක්ෂා වන්නේ එසේ වූ විට ය. මේ කරුණු සැලකිල්ලට ගෙන පංච සීල ශික්ෂණයෙන් යුතු ව රටක් සමාජයක් පාලනය කරන පාලකයා නිසා සාමකාමී පරිසර වටපිටාවක් නිර්මාණය වේ. එය එම සමාජයේ ආර්ථික, දේශපාලනික, සාමාජික යන සියලු අංශවල සංවර්ධනයට හේතුවේ.

5. ■ චතු අප්පමඤ්ඤා

6. ■ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා

7. ■ මෙත්තා හෙවත් මෛත්‍රිය යනු හිතවත්කමයි. මිතුරු කමයි. සෑම පාලකයකු ම තම මිතුරකු සම්බන්ධ ව පවත්නා හිතවත්කමට සමාන හිතවත්කමක් තම රට වැසියන් කෙරෙහි ද, සියලු සත්ත්වයන් කෙරෙහි ද දැක්වීමට යොමු විය යුතු ය. එය කළ හැකි වන්නේ දියුණු කළ සිතුවිලි ඇති අයට පමණි. එබඳු පාලකයන්ගෙන් ජනතාවට කිසිදු අගතියක් සිදු නොවේ.

- කරුණාව නම් දුකට පත් වූවන් දුකෙන් මුදවා ගැනීම සඳහා සිතෙහි ඇති වන අනුකම්පාවයි. පාලකයා නිතර ම සියලු රටවැසියන් තම දරුවන් ලෙස සිතා කටයුතු කළ යුතු ය. දරුවකුට විපතක්, කරදරයක් ඇති වූ විට වහා ම එයට විසඳුම් සෙවීමට යොමු වන පියකු මෙන් ක්‍රියා කළ යුතු ය.

■ අනුන්ගේ දියුණුව, දැක සතුටට පත් වීම, ඊර්ෂයා නොකිරීම මුදිතාවයි. රාජ්‍ය නායකත්වයට ද තම ජනතාවගේ දියුණුව හා සතුට දැක අවංක ව ම ඒ ගැන සිතා සතුටු වීමේ හැකියාවක් පැවැතිය යුතු ය. මුදිතාව තුළින් ක්‍රෝධය, පළිගැනීම වැනි අවගුණ සම්පූර්ණයෙන් ම බැහැර වේ. දයාව කරුණාව වැනි උතුම් ගුණ ජනිත කෙරේ.

■ කෙනකුගේ සිත තුළ උපදින මැදහත් බව උපේක්ෂාවයි. නමුත් කිසි ම දෙයක් ගණන් නොගෙන කටයුතු කිරීමේ ගතිය මෙයින් අදහස් නො කෙරේ. ජනතා සේවය සලසන පාලකයකුට ජනතාවගෙන් කීර්ති ප්‍රශංසා පමණක් නොව නින්දා අපහාස ද ලැබෙයි. ලාභ මෙන් ම අලාභ ද යසස මෙන් ම අයස ද හිමි වේ. ඒ කිසිවක් පිළිබඳ ව කම්පා නොවී උපේක්ෂාවෙන් පාලකයා කටයුතු කළ යුතුය.

■ සිව් බඹ විහරණයෙන් තම පාලන කටයුතු මෙහෙයවන පාලකයා කුමන මෙහොතකවත් ජාති, කුල, ආගම්, පක්ෂ, පාට ආදී පටු වාද භේද නොසලකා කටයුතු කරයි. එවිට ඔහු වෙත ජනතා ආකර්ෂණය නිතැතින් ම හිමිවේ. එබඳු පාලකයාගේ පැවැත්ම හා ප්‍රජාවේ යහපත සිදුවේ.

## පාඩම - 23 ලොව්තුරු සුවේ පදනම සම්මා දිට්ඨියයි

1. ■ දම්සක් පැවතුම් සූත්‍රය.

2. ■ ශීල, සමාධි, ප්‍රඥා

3. ■ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප යන අංග දෙක ප්‍රඥාව ශික්ෂාවට අයත් ය.

■ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග තුන ශීල ශික්ෂාවට අයත් ය.

■ සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අංග තුන සමාධි ශික්ෂාවට අයත් ය.

4. ■ තමන් කරන ක්‍රියාවන්හි විපාක තමන් කරා පැමිණෙන බව දැකීම කම්මස්සකතා සම්මා දිට්ඨියයි.

■ ලෞකික ධ්‍යාන උපදවාගත් පසු සිල් රැකීමෙන් හා සිත පිරිසිදු කර ගැනීමෙන් ඇතිවෙන විශේෂ ප්‍රතිලාභ නිවැරදි ව දැන ගැනීම ධ්‍යාන සම්මා දිට්ඨියයි.

■ සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීම - විදර්ශනා සම්මා දිට්ඨියයි.

■ සෝවන් ආදි මාර්ග සිත්වල පහළ වන සිව්සස් අවබෝධ කර ගන්නා දැක්ම - මාර්ග සම්මා දිට්ඨියයි.

■ සෝවන් ආදි ඵල සිත්වල ඇතිවෙන දැක්ම - ඵල සම්මා දිට්ඨියයි.

5. ■ නෙක්ඛම්ම සංකප්ප

■ අව්‍යාපාද සංකප්ප

■ අවිහිංසා සංකප්ප වශයෙන් ත්‍රිවිධ වේ.

■ වස්තු කාම හා ක්ලේශ කාමයන්ගෙන් වෙන් වී හෙවත් අතහැර ගිහි ගෙහි සම්බාධ අවබෝධ කරගෙන පැවිදි වීමට පහළ වන සිතුවිලි නෙක්ඛම්ම සංකප්ප නමින් හැඳින්වේ.

■ ද්වේෂය, වෛරය, ක්‍රෝධය, තරහව ආදි සිතුවිලිවලින් බැහැර ව මෙත්තා සහගත සිතුවිලිවලින් වාසය කිරීම අව්‍යාපාද සංකප්ප නමින් හැඳින්වේ.

■ සතුන්ට හිංසා පීඩා නොකොට දුකට, කරදරයට පත් අය කෙරෙහි හිංසාවේ ආදීනව දැක එයින් බැහැර වීමේ සිතුවිලි අවිහිංසා සංකප්ප නමින් හැඳින්වේ.

6. ■ සතුන් නොමැරීම

■ සොරකම් නොකිරීම

■ කාමයන්හි වරදවා නොහැසිරීම

7. ■ භික්ෂුවක් නැති ගුණ ඇඟවීමේ කුහනා, ලපනා ආදි විසිඑක් වැදෑරුම් වංචනික දූරාචාරවලින් වැළකී, දැහැමි අයුරින් සිව්පසය ලබා ජීවත් වීම.

8. ■ දැහැමි ජීවන වෘත්තියක යෙදීම

■ වෙළෙඳාම ජීවන වෘත්තිය ලෙස සිදු කරන්නේ නම් වසවිස, සතුන්, මස්, ආයුධ, මත්පැන් යන වෙළෙඳාම් පහෙන් වැළකීමත්, හොර කිරුම්, මිනුම්, වැරැදි මුදල් භාවිත කිරීම්වලින් වැළකී දැහැමි වෙළෙඳාමක යෙදීම.

9. 1. නූපන් අකුසල් නූපදවීම

2. උපන් අකුසල් නැති කිරීම

3. උපන් කුසල් වැඩි දියුණු කිරීම

4. නූපන් කුසල් ඉපදවීමට ගන්නා උත්සාහය

10. 1. කය අනුව බැලීම කායානුපස්සනාව

2. වේදනාව අනුව බැලීම වේදනානුපස්සනාව

3. ධර්මය අනුව බැලීම ධම්මානුපස්සනාව

4. සිත අනුව බැලීම චිත්තානුපස්සනාව

11. ■ දම්සක් පැවතුම් සූත්‍රය, සච්ච විභංග සූත්‍රය, සතිපට්ඨාන සූත්‍ර